# ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ ජනාධිපතිවරණවලදී ඉරිදා සිංහල මාධ්‍ය පුවත්පත්හි පළවූ වාර්තාවල අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණයක්

ටී.වී.කේ.පී.එන්. කුමාරි

**FGS/03/02/06/2011/05**



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1198 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලය

දර්ශනපති උපාධිය

2014

# නිබන්ධන සාරාංශය

මෙම පර්යේෂණය මගින් මූලික අවධානය යොමු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති ජනාධිපතිවරණවල දී පුවත්පත් එක්, එක් දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කරන ලද ඉඩ ප්‍රමාණයත්, එම පුවත්පත් හැසිරී ඇති ආකාරයත් සොයා බැලීමයි. ඒ සඳහා ඉරිදා දින පළ වී තිබූ මාධ්‍ය පුවත්පත් නියැදිය ලෙස යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණය තුළ අන්තර්ගත වන්නේ එම පුවත්පත් අන්තර්ගත විශ්ලේෂණයට බඳුන් කර ලබා ගත් තොරතුරු ය.

මෙම අධ්‍යයනය සඳහා යොදාගනු ලැබුවේ ශ්‍රී ලංකාවේ පුවත්පත් වන හෙයින් ශ්‍රී ලංකාවේ පුවත්පත් ඉතිහාසය සහ පුවත්පත් ආයතනවල ආරම්භය සහ විකාශනය යන්න කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. පර්යේෂණයෙහි ප්‍රධාන අංශය වන්නේ දේශපාලනය සහ පුවත්පත අතර පවත්නා වූ සම්බන්ධතාවයයි. එබැවින් පුවත්පතෙහි දේශපාලන පැතිකඩ ඉදිරිපත් කිරිම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. මේ යටතේ දේශපාලනය යන්න පිළිබඳ ලොව විද්වතුන් ඉදිරිපත් කර තිබෙන්නා වූ විවිධ අදහස් මෙන්ම දේශපාලකයින් විසින් විවිධ අවස්ථාවල දී පුවත්පත් පාලනය කිරීම, ජනමාධ්‍යවේදීන්ට පහරදීම සහ ඝාතනය කිරීම, මාධ්‍ය ආයතනවලට තර්ජනය කිරීම, වාරණ දැමීම, එමෙන්ම මැතිවරණ සමයේ පුවත්පත් හැසිරී තිබෙන්නා වූ ආකාරය යනාදිය කෙරෙහි අවධානය යොමුකරන ලදී. ලොව විවිධ රටවල් විසින් මැතිවරණ සමයේ දී පුවත්පත් පාලනය කර තිබෙන්නා වූ ආකාරය සහ මැතිවරණ ප්‍රචාරක කටයුතු මෙහෙයවා ඇති ආකාරය පිළිබඳව ද කරුණු ඇතුළත් කර තිබේ.

නිබන්ධන මාතෘකාවේ ප්‍රධාන අනෙක් අංශය වන්නේ ජනාධිපතිවරණ වන හෙයින් ජනාධිපතිවරණය පැවැත්වීමට පෙර ලංකාවේ පැවති පාලන රටාව පිළිබඳවත්, ජනාධිපතිවරණයෙන් පසු පාලනය ගෙන යන ආකාරය පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කර ඇත. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා සතු බලතල සහ මෙතෙක් සිදුව ඇති සංශෝධන, ජනාධිපතිවරයා පත්කර ගන්නේ කෙසේද සහ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතෙහි සඳහන් ඇතැම් කරුණු මෙහි ඇතුලත් වේ.

ජනාධිපතිවරණ සම්බන්ධයෙන් වැඩිදුරටත් තොරතුරු ඉදිරිපත් කිරීමේ අරමුණින් ජනාධිපතිවරණ සමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් සහ විවිධ සංවිධාන මගින් ඉදිරිපත් කර ඇති වාර්තා, ජනාධිපතිවරණය සම්බන්ධයෙන් මෙතෙක් ඉදිරිපත් කර ඇති ඡන්ද පෙත්සම් මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයා විසින් මාධ්‍ය වෙත නිකුත් කරන ලබන උපමාන යනාදිය ද මෙම පර්යේෂණයේ දී සාකච්ඡාවට බඳුන් කරන ලදී.

## Key words

දේශපාලන පක්ෂ, ජනාධිපතිවරණ

පුවත්පත් ඉතිහාසය, සිංහල මාධ්‍ය පුවත්පත්, මැතිවරණ ප්‍රචාරක කටයුතු

# ABSTRACT

The root cause for this research was to focus its attention to find out as to how much of space allowance had been made political party-wise in newspapers and how the papers had behaved during the Presidential elections so far held in Sri Lanka. Reports published in Sinhala media on Sunday were used as aid in this connection, Contents of such reports were analyzed and included in this report.

As Sri Lanka newspapers were used for this study a concern had to be made about the history and the expansion of such newspaper establishment too.

The main section of this research is the connection shown between politics and newspapers. Therfore special effort is made to show the political affiliation of a newspaper. Also details have been included here to show how various countries in the world have controlled the newspapers and have maneucered their election campaigning works.

Presidential Election is the other main section if this Research. Here detailed reports are included about the governing sysytems prevailing and prevailed in and before presidential election periods.

In 1978 with the change of statutory powers vested with the President and various other amendments made to date, the Presidential laws explain how a President should be elected. This procedure is discussed under this research and details included.

With the aim of discussing further about the Presiedntial Election, the reports tendered by the election observing teams, the petitions so far received in connection with the election and the election commissioner's observations issued to the media are also some subjects discussed in this research.



## Key words

Presidential Election, Political party, Sri Lankan newspapers, Politics and newspapers, Election commissioner